// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2366/22 – 2024 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා – 2024.01.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත

33 වන වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ වන මා විසින්, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමතය සහිතව, මේ නිවේදනය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥාපනතේ කාර්යය සඳහා ''පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ භූමියක්'' ලෙස සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ,**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2023 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

1A – G 41224 – 07 (2024/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

## පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ බෙලිගල ගල භූමි ප්‍රදේශය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළය / ඕතර පත්තුව, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 81A කුඹල්ගම ග්‍රාම නිලධාරි වසමේ බෙලිගල යන ගම පිහිටි බෙලිගල ගල නැමැති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් මැන සාදන ලද මු.පි.කෑ. 2785 (RD No. 53/24 (1/23 4A) හා 1998.09.10 දින දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 01 දරන කොටසට මායිම් ව:-

*උතුරට* : සේනානායක පවුල සහ උදලාගම පවුල විසින් හිමිකම් කියන ගල් අස්සේ හේන, තැඹිලියද්ද සහ ඇතුල්වත්ත;

*නැගෙනහිරට* : සේනානායක පවුල සහ උදලාගම පවුල විසින් හිමිකම් කියන ඇතුල්වත්ත, ඇල්හේන, මාර්ගය, සේනානායක පවුල සහ උදලාගම පවුල විසින් හිමිකම් කියන ඇල්හේන සහ ටී. එම්. සත්‍යරත්න විසින් හිමිකම් කියන වලව්වත්ත;

*දකුණට* : ටී. එම්. හීන් මැණිකේ විසින් හිමිකම් කියන වලව්වත්ත, එල්. රූපසිංහ විසින් හිමිකම් කියන වලව්වත්ත, එස්. එම්. ගුණවර්ධන විසින් හිමිකම් කියන උඩහවලව්ව සහ සේනානායක පවුල සහ උදලාගම පවුල විසින් හිමිකම් කියන අස්වැද්දුම පොල් ඉඩම;

*බටහිරට* : සේනානායක පවුල සහ උදලාගම පවුල විසින් හිමිකම් කියන අස්වැද්දුම පොල් ඉඩම, ඇළ, සේනානායක පවුල සහ උදලාගම පවුල විසින් හිමිකම් කියන ගල් අස්සේ හේන සහ තැඹිලියද්ද.

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් නමයයි දශම හයයි හයයි දෙකයි බිංදුවක් (හෙක්ටයාර් 9.6620) ක් වූ ඉඩම් කොටස්වලින් සමන්විත වේ.

EOG 01 – 0089

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.